# බුදුන්වහන්සේ අපේ කාලයේ හා කලාපයේ විරුවාණන් ලෙස

බුදුන්වහන්සේ ලෝකෝත්තර වූහ. උන්වහන්සේගේ ප්‍රධාන කාර්යය වූයේ දුකින් පෙළෙන සත්ත්වයන් සසරින් එතෙරකිරීම ය. බුදුන්වහන්සේගේ දහම් ඇසීමෙන් නිවන් අවබෝධ කරගත් උතුමෝ බොහෝ වෙති. එහෙත් උන්වහන්සේගේ කාර්යය ලෝකෝත්තර කර්තව්‍යයන්ට පමණක් සීමා නො වී ය. එදා කළයුතුව තිබූ ඇතැම් ලෞකික කාර්යයන් ද උන්වහන්සේ විසින් සිදුකෙරිණි. බුදුන්වහන්සේගේ ලෝකෝත්තර ගුණවලට අබමල් රේණුවක හෝ අඩුවක් පාඩුවක් නොකර ලෞකික වශයෙන් සිතා බැලුව ද උන්වහන්සේ අවුරුදු දෙදහස් පන්සියයකට වැඩි කාලයක් අපේ කලාපයේ, එනම් අද දකුණු ආසියාව යැයි හැඳින්වෙන ප්‍රදේශයේ, උත්තරීතර විරුවාණන් වහන්සේ වූහ. එසේ ප්‍රකාශ කිරීමෙන් උන්වහන්සේට කිසිම වූ ආකාරයක අගෞරුවයක් වන්නේ යැයි නො සිතමු.

බුදුන්වහන්සේ අපේ කලාපයේ  උත්තරීතර විරුවාණන් වහන්සේ පමණක් නො වෙති. උන්වහන්සේ අපේ කාලයේ ද විරුවාණන් වහන්සේ වෙති. බුදුන්වහන්සේ පිරිනිවන් පෑමෙන් අවුරුදු දෙදහස් පන්සියයකටත් වඩා ඉක්මගොස් ඇති විට උන්වහන්සේ අපේ කාලයේ විරුවාණන් වහන්සේ වන්නේ කෙසේ දැයි කිසිවකුට හෝ ප්‍රශ්නයක් විය හැකි ය. එසේ වන්නේ ඇයි? සිදුහත් කුමරු එදා උපන් සමාජය හා අද අපේ සමාජය අතර වෙනස්කම් කෙතෙක් තිබුණ ද ඒ සියල්ල නොගිණියහැකි මට්ටමකට දමන සමානකමක් ඒ සමාජ අතර වෙයි. ඒ වෙන කිසිවක් නොව බටහිරින් අපේ කලාපයට පැමිණි සංස්කෘතික හා දේශපාලන ආක්‍රමණය ය. දකුණු ආසියාව නමින් අද හැඳින්වෙන කලාපයේ ඉතිහාසය එකට හැදෑරීමේ වැදගත්කමක් වෙයි. ඒ සමස්තයක් ලෙස හැදෑරීමේ දී පෙනී යන කරුණක් නම් අද ආර්ය හා ද්‍රවිඩ යනුවෙන් හැඳින්වෙන වෙනස බ්‍රිතානීන් ප්‍රමුඛ බටහිරයන් විසින් කරන ලද විකෘතියක් බව ය.

භාරතයේ වයඹ දිගින් අපේ කලාපයට ආර්යයන් යැයි හැඳින්වෙන පිරිසක් බටහිරින් කඩාවැදීමට පෙර මේ කලාපයේ ජීවත්වූවෝ ඊනියා ද්‍රවිඩයෝ නො වූහ. අපේ කලාපයේ ජීවත් වූ ඒ පැරණි ගෝත්‍රිකයන් හැඳින්වීමට නමක් අවශ්‍ය ම නම් ඔවුන්ට අනාර්යයන් යැයි කිවහැකි ය. මේ අනාර්යයෝ භාරතයේ වයඹ සිට ඊසානයටත් නැගෙනහිර සිට බටහිරටත් කලාපයේ උතුරේ හිමාල කඳු පාමුලේ සිට දකුණේ ලංකාවටත් පැතිරී සිටියහ. ඔවුන්ට ඔවුන්ගේ ම වූ චින්තනයක් තිබුණු අතර විවිධ ගෝත්‍රවලට පොදු වූ මෙන් ම ගෝත්‍රයෙන් ගෝත්‍රයෙන් ගෝත්‍රයට වෙනස් වූ චාරිත්‍ර චාරිත්‍ර ද විය.

අද ඇතැම් සිංහල හෝ දෙමළ හෝ වූ දෙමළ ජාතිවාදී පුරාවිද්‍යාඥයන් මහා පඩිබවකින් කතාකරන මෙගලිතික සොහොන් බිම් එදා භාරතයෙහි ද ලංකාවෙහි ද දැකිය හැකිවූයේ ඒ අනාර්ය සංස්කෘතීන්හි ලක්ෂණ වීම හේතුකොටගෙන ය. එහෙත් මෙයින් අදහස් කෙරෙනුයේ අනාර්ය යනු ද්‍රවිඩ යන්න නො වෙයි. බ්‍රිතානීන්ගෙන් ආභාසය ලත් අනුකාරක ඉතිහාසඥයන් හා පුරාවිද්‍යාඥයන් කරන සමාව නොදිය හැකි වරදක් නම් සියළුම අනාර්යයන් ද්‍රවිඩ ලෙස සැලකීම ය. ද්‍රවිඩ යන්න සොලීන් දකුණු ඉන්දියාවේ බලවත් වීමෙන් පසුව ඒ ප්‍රදේශයේ ඔවුන්ගේ අණසකට යටත් වූ ගෝත්‍ර කිහිපයක් හැඳින්වීම සඳහා යොදාගන්නා ලද වචනයක් මිස සමස්ත භාරතය හා ලංකාව සම්බන්ධයෙන් යොදාගත හැකි සංකල්පයක් නො වෙයි.

කෙසේ හෝ සිදුහත් කුමරු ද උපන්නේ අනාර්ය ගෝත්‍රයක හා වංශයක ය. අනුකාරක උගත් එහෙත් බුද්ධිමතුන් නොවූ ඉතිහාසඥයන් හා පුරාවිද්‍යාඥයන්ට අනුව නම් සිදුහත් කුමරු ද ද්‍රවිඩ විය යුතු ය. ඔවුන් දන්නා (ඒ හරියට දන්නේ යැයි ඉන් ගම්‍ය නො වෙයි.) එකම න්‍යාය වූ ද්විකෝටික න්‍යායට අනුව ආර්ය නොවන්නේ නම් ඒ ද්‍රවිඩ වෙයි. සිදුහත් කුමරු ගෝත්‍රයෙන් ගෞතම විය, වංශයෙන් ශාක්‍ය විය. සුදොවුන් රජතුමා ද එසේ ම විය. එහෙත් මහාමායා දේවිය මෙන් ම ප්‍රජාපතී ගෝතමිය ද ගෝත්‍රයෙන් ගෞතම ද, වංශයෙන් කෝලිය ද විය. බුදුන්වහන්සේ ගෞතම යන තම ගෝත්‍ර නාමයෙන් හඳුන්වාගැනීම පිළිබඳ ව ඕල්කට් බෞද්ධයන් තම සංස්කෘතිය අනුව විරුද්ධ විය යුත්තේ ඕල්කට් සංස්කෘතියෙහි බුදුන්වහන්සේට පමණක් නොව බෞද්ධයන්ට ද ජාති ගෝත්‍ර ආදිය නැතිවීම හේතුකොටගෙන ය. එහෙත් සිංහල බෞද්ධයනට එවැනි ඊනියා බුද්ධිවාදී මත නොමැත.

© Prof. Nalin De Silva

සිදුහත් කුමරු ඉපදීමට අවුරුදු දහසකට පමණ පෙර භාරතය ආක්‍රමණය කළ ආර්යයෝ අපේ කලාපයට ඔවුන්ගේ චින්තනය ද, දැනුම ද, සංස්කෘතිය ද හඳුන්වාදුන්හ. ඒ අතර අසුන් පිට යෑම පමණක් නොව එක දේව සංකල්පය ද, යාග හෝම ද, වර්ණ භේදය ද, ඒ සියල්ලම කැටිකළ බමුණු මත ද විය. ආර්ය ආක්‍රමණයට පෙර භාරතය බහු දේවවාදී විය. එකල ද සංසාරය පිළිබඳ සංකල්පය භාරතීයයන් අතර විය. එහෙත් ඔවුන් අතර කර්මවාදයක් යනුවෙන් ප්‍රවාදයක් තිබිණි යැයි සිතිය නො හැකි ය. පැරණි භාරතීයයෝ වත්මන් සිංහලයන් මෙන් ම ප්‍රවාද ගොඩනැගීමට රුචියක් හෝ දක්ෂතාවක් හෝ නො දැක්වූහ. (විස්තර සඳහා විදුසර ලිපි කියවන්න) පැරණි භාරතීයයන්ට අනුව සංසාර ගමන නැවැත්විය හැකිවූයේ තම උත්සාහයෙන් ය. ඒ සඳහා භාවනා කළ යුතු විය. යෝග අභ්‍යාසයෙහි නිරත විය යුතු විය. ඔවුහු බාහිරයට නොව අභ්‍යන්තරයට සිත් යොමු කළහ. සත්‍යය සෙවීමට ලෝකය පුරා යෑමට ඔවුන්ට අවශ්‍ය නො වීය. සත්‍යය තමන් ළඟම තිබුණි. බටහිර වැඩවසන ඇතැම් භික්ෂූන් වහන්සේ නමක් කීමට තැත්කරන ආකාරයෙන් මෙන් නොව, මෙය බුදු දහමට පමණක් සීමාවූවක් නො වෙයි. අවශ්‍ය නම් එයට පැරණි භාරතීය චින්තනය යැයි කිවහැකි ය. ඒ පැරණි අනාර්ය චින්තනයෙන් ගලා ආවක් විය. සාත්‍රේ හෝ වෙනත් අයකු සත්‍යය තමන් ළඟ ඇතැයි පවසන්නේ යැයි කියමින් ඒ බුදු සමය යැයි කීම කරුණු විකෘතිකිරීමකි.

භාරතය ආක්‍රමණය කළ ආර්යයෝ මේ සියල්ල කණපිට පෙරළූහ. සියළු දෙවිවරුන් අභිබවා බ්‍රහ්මන් මතු විය. එහෙත් බ්‍රහ්මන්ට වුව ද පැරණි බහු දේවවාදයෙන් මුළුමණින් ම ඉවත්වීමට නො හැකිවිය. බ්‍රහ්මන්ට ද ශිව, විෂ්ණු, ඊශ්වර යනුවෙන් අඩුම තරමින් ත්‍රිමුර්තියකින් පෙනී සිටීමට සිදුවිය. සංසාර සංකල්පය ආර්ය සංස්කෘතියෙහි ද මුල් බැස ගත්තේ ය. පැරණි භාරතීය සංස්කෘතියෙහි ප්‍රබලත්වය හේතුකොටගෙන එහි ඇතැම් අංග ආර්ය සංස්කෘතියට ද අවශෝෂණය කෙරිණි. ආක්‍රමණික ආර්යයන්ගේ හා පැරණි භාරතීයයන්ගේ සංස්කෘතීන්හි මිශ්‍රණයෙන් නව සංස්කෘතියක් හා චින්තනයක් භාරතයෙහි ඇතිවිය. මේ සංස්කෘතිය හා චින්තනය අපි වෛදික නමින් හඳුන්වමු.

සංසාරය ද බ්‍රහ්මන් ද ආත්මය ද සංසාරය තේරුම්කිරීම සඳහා කර්ම ප්‍රවාදය ද එකට මිශ්‍රකර තනාගත් වෛදික සංස්කෘතියෙහි විමුක්තිය ලබාගත හැකිවූයේ අභ්‍යන්තර වශයෙන් නොව බාහිර වශයෙන් ය. විමුක්තිය සඳහා බාහිර බලවේගයක ආධාරය පැතීම මැදපෙරදිග බිහි වූ බොහෝ සංස්කෘතීන්හි ලක්ෂණයක් වෙයි. යෙහෝවා දෙවියන් හා අල්ලා දෙවියන් ඒ සංස්කෘතියෙන් අද ද ඉතිරි වී ඇති සංකල්ප වෙයි. පසුකලෙක වත්මන් බටහිර සංස්කෘතියෙහි ප්‍රධාන ලක්ෂණයක් වූයේ ද මේ බාහිර බලවේගය ය. බටහිර විද්‍යාවේ පුරෝගාමියා වූ බටහිර භෞතික විද්‍යාවෙහි ආරම්භයේ දී ම මෙන් අයිසැක් නිව්ටන් විද්වතා බාහිර බලයක් ගැන කතාකරන්නේ මේ චින්තනයෙහි පදනම්වෙමින් ය. කෙසේ හෝ වෛදිකයෝ විමුක්තිය සඳහා අභ්‍යන්තරයේ යෝග ධ්‍යාන වෙනුවට බාහිර යාග හෝම බලි බිලි ආදිය මත පදනම්කරගත් ආගමික පද්ධතියක් ගොඩනැගූහ.

වාසනාවකට වෛදික සංස්කෘතිය භාරතයෙහි ඊසානයට, නැගෙනහිරට හා දකුණට ගලායෑමට කාලයක් ගතවිය. සිදුහත් කුමරු ඉපදෙන කාලයෙහි භාරතයේ නැගෙනහිර හා ඊසානයෙහි පැවතියේ අර්ධ වෛදික සංස්කෘතියක් හා චින්තනයකි. ශාක්‍යයන්ට අවවාද අනුශාසනාකළ බමුණන් ගැන අපට අසන්නට නො ලැබෙයි. කෞටිල්‍යලා වෙනුවට අපට කියවන්නට ඇත්තේ අසිත තවුසන් ගැන ය. ඊසානදිග භාරතයෙහි හා නැගෙනහිර භාරතයෙහි බ්‍රාහ්මණ මත හා වෛදික සංස්කෘතිය බලපෑමක් කළ ද ඒ බටහිර භාරතයෙහි තරම් නො වි ය. බුදුන්වහන්සේ මේ අර්ධ වෛදික සංස්කෘතික ආක්‍රමණයට ලෞකික වශයෙන් ගත්කල විරුද්ධවූහ. උන්වහන්සේ එයට විරුද්ධව මතවාදී අරගලයක නිරත විය. අනුකාරක භාරතීය ඉතිහාසඥයන් බුදු සමයේ පැතිරීම කසිකබල් මාක්ස්වාදී මත පදනම් කරගනිමින් ඊනියා වෙළෙඳ පංතියක ඇතිවීමට ඌනනයකිරීමට උත්සාහකළ ද බුදු සමය චින්තන විප්ලවයක් විය. විප්ලවය යන්න මාක්ස්වාදයෙන් ගැනීමට උත්සාහ දරන්නන් නොදන්නා දෙයක් නම් බුදුන්වහන්සේ ද විප්ලවයක් කළ බව හා මාක්ස්වාදය යනු අවසාන විග්‍රහයෙහි දී බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි අවියක් බව ය. ලෝකයේ වෙනත් බොහෝ රටවලට මෙන් ම අපේ කලාපයට ද නැවතත් බටහිර සංස්කෘතික ආක්‍රමණයක් එල්ල වී ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ව්‍යාපෘතිය වූ මෙය දැන් අවුරුදු පන්සියයක් පමණ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙයි. එදා මෙන් ම අද ද බමුණෝ වෙති. වත්මන් බමුණන්ගේ කාර්යභාරය වී ඇත්තේ මුළු ලොවම ආගමින් බැරිනම් සංස්කෘතියෙන් ක්‍රිස්තියානිකිරීම සඳහා දැනුම නිර්මානයකිරීම ය. එහි දී ආර්ය ආක්‍රමණයේ දී මෙන් නොව දේශපාලන හා ආර්ථික යටත්විජිතවාද ද එක්වී ක්‍රියාකරනු දැකිය හැකි ය. බුදුන්වහන්සේ ගත් මග අනුව යමින් වත්මන් බමුණු මත පරාජයකිරීමට කටයුතුකිරීම අපේ වගකීම වෙයි.

© Prof. Nalin De Silva